සීමාසහිත මොබිටෙල් (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන් - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත මොබිටෙල් (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයන්ගේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර

තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමූහය කටයුතු කර ඇති බව,
- සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
යටිතල පහසුකම් හුවමාරුව, දේශීය අන්තර් සම්බන්ධතාවය, බාහිර ද්වාර මෙහෙයුම්, රෝමිං සහ වෙනත් ගිණුම් ඇතුළු ගිණුම් කිහිපයක් හරහා වසර 5 කට වැඩි කාලයක සිට හිඟව ඇති එකතුව රු. මිලියන 78.17 ක ගෙවිය යුතු ශේෂයන් හඳුනාගෙන තිබුණි. මේවා 2024 දෙසැම්බර් 31 වන දිනට සැපයුම්කරුවන්ගෙන් ලද ගෙවීම් කර නොමැති ඉන්වොයිසි නියෝජනය කරයි.	වෙනත් ගෙවිය යුතු මුදල්: වෙනත් ගෙවිය යුතු ගිණුම් යටතේ ඇති පොරොත්තු ඉන්වොයිසි ප්‍රධාන වශයෙන් ආරවුල් සහිත ඉන්වොයිසි, ගෙවීම් අහරුවීම් සහ කල් ඉකුත් වූ චෙක්පත් නියෝජනය කරයි. අප විසින් සමාලෝචනය සිදු කරමින් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර සමහර ඉන්වොයිසි දැනටමත් ගෙවා ඇත. යටිතල පහසුකම් හුවමාරුව/ දේශීය අන්තර් සම්බන්ධතාවය/ බාහිර ද්වාර මෙහෙයුම – මෙම ශේෂයන් ප්‍රධාන වශයෙන් සැපයුම්කරුවන් සමඟ ඇති ආරවුල් හේතුවෙන් ගෙවීමෙන් තොරව පවතී.	ගෙවීම් ප්‍රමාද වීමට හේතු සහ ඒවායේ වලංගුභාවය තීරණය කිරීම සඳහා හිඟ ශේෂයන් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් කළ යුතුය. ඕනෑම නොගැලපීම් හෝ ආරවුල් කඩිනමින් විසඳිය යුතුය.

1.6 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියේ (අනුවාදය 4.0) 8.1 වගන්තියට අනුව, ප්‍රතිපත්තිය වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. කෙසේ වෙතත්, ලේඛන පාලන වාර්තාවල දැක්වෙන පරිදි, සමාගම 2021 ජූනි මාසයේදී අවසන් වරට සමාලෝචනය කරන ලද යල් පැන ගිය අනුවාදයක් යටතේ ක්‍රියාත්මක වේ.	එකඟ වේ.	අඛණ්ඩ අදාළත්වය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය වාර්ෂිකව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

(ii) තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති අනුවාදය 4.0 හි 16.6.3 වගන්තිය මගින් අවශ්‍ය කරන පරිදි සමාගම විසින් යෙදුම් මට්ටමේ මුරපද සැකසුම් නිසි ලෙස වින්‍යාස කර නොතිබුණි.	එකඟ වේ.	කළමනාකරණය තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් මුරපද වින්‍යාසයන් බලාත්මක කළ යුතුය.
(iii) Mcash ගිණුම් 21 ක සහ හැඳුනුම්කරණ ප්‍රවේශ කළමනාකරණය (Identity Access Management) පද්ධතියේ ගිණුම් 21 ක ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් අක්‍රිය කිරීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රමාදයන් පවතී.	ඉල්ලා අස්වීමේ දිනයන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතීන් අතර ඇති විය හැකි නොගැලපීම් හේතුවෙන්, අවශ්‍ය සියලු අනුමැතීන් ලැබෙන තෙක් මානව සම්පත් අංශය පරිශීලක ගිණුම් අවසන් කිරීමේ ඉල්ලීම් ප්‍රමාද කළ හැකිය.	ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් ප්‍රමාදයකින් තොරව අක්‍රිය කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 1,877 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පාඩුව රු.මිලියන 1,825 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 3,702 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ගනුදෙනුකරුවන් සමඟ ඇතිකර ගත් ගිවිසුම්වලින් ලද ආදායම රු. මිලියන 3,144 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ආදායම, පොලී ආදායම සහ මූල්‍ය පිරිවැය, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත පරිදි වේ.

විස්තරය	2023 රු. මිලියන	2024 රු. මිලියන	විචල්‍යතා වටිනාකම වැඩිවීම/(අඩුවීම) රු. මිලියන	විචලනය (%)	විචලනයට හේතුව
ආදායම	42,636	45,780	3,144	7	දේශීය සෙලියුලර් මෙහෙයුම් සහ හැන්ඩ්සෙට්, මොඩම්, සිම් කාඩ්පත් අලෙවිය වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 3,144 කින් ආදායම වැඩි වී ඇත.
පොලී ආදායම	390	276	(114)	(29)	පොලී අනුපාත අඩු කිරීම සහ විනිමය අනුපාතිකය

					අවප්‍රමාණය වීම හේතුවෙන් පොලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 114 කින් අඩු වී ඇත.
මූල්‍ය පිරිවැය	1,039	1,483	444	42	රුපියල් ණය සඳහා පොලී වියදම් සහ අදාළ ගාස්තු වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය පිරිවැය රු. මිලියන 444 කින් වැඩි වී ඇත.

2.3 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමූහයේ පසුගිය වසර තුන සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

අනුපාතය	**2024**	**2023**	**2022**
ජංගම අනුපාතය	79.77%	71.66%	84.34%
ක්ෂණික අනුපාතය	77.53%	69.80%	82.33%
කොටසක ඉපැයීම	රු. 0.11	(රු. 2.77)	(රු. 0.09)
දළ ලාභ අනුපාතය	66%	62%	66%
ශුද්ධ ලාභ අනුපාතය	0.30%	(8.56%)	(0.27%)
ස්කන්ධය මත ප්‍රතිලාභය	1.05%	(27.65%)	(0.91%)
ණය අනුපාතය	58%	56%	50%
වත්කම් පිරිවැටුම් අනුපාතය	වාර 0.55	වාර 0.54	වාර 0.60
මුළු වත්කම් මත ප්‍රතිලාභය	0.17%	(4.66%)	(0.16%)
ස්කන්ධ අනුපාතය	42%	44%	50%
ණය ස්කන්ධ අනුපාතය	වාර 3.66	වාර 3.32	වාර 2.86

(i) 2023 වර්ෂය සමඟ සසඳන විට, 2024 වර්ෂයේදී ජංගම අනුපාතය සියයට 71.66 සිට සියයට 79.77 දක්වා වැඩි වී තිබූ අතර ක්ෂණික වත්කම් අනුපාතය සියයට 69.80 සිට සියයට 77.53 දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව, 2023 වර්ෂය හා සසඳන විට 2024 වර්ෂයේදී සමූහයේ ද්‍රවශීලතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙම අනුපාත 2022 වර්ෂයේ වාර්තා වූ මට්ටම්වලට ළඟා වී නොතිබුණි.

(ii) දළ ලාභ අනුපාතය සියයට 62 සිට 66 දක්වා වැඩි වීම හේතුවෙන් සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ලාභදායීතාවය වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය.

(iii) 2023 වර්ෂයේදී සමාගම සැලකිය යුතු ශුද්ධ අලාභයක් වාර්තා කළද, 2024 වර්ෂයේදී ශුද්ධ ලාභ අනුපාතය ඍණ සියයට 8.56 සිට සියයට 0.30 දක්වා වැඩි වී තිබුණි. සමාගම සහ එහි පරිපාලිත සමාගම් ධනාත්මක ශුද්ධ ලාභයකට නැවත පැමිණියද, ස්කන්ධයට සාපේක්ෂව ලාභය ඉතා අඩු බව නිරීක්ෂණය විය. ව්‍යාපාරය එහි කොටස් හිමියන්ට ඉතා සුළු ප්‍රතිලාභ ජනනය කරයි.

(iv) සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල කොටසකට ඉපැයීම 2023 වර්ෂයේදී ඍණ රු. 2.77 සිට 2024 වර්ෂයේදී රු. 0.11 දක්වා වැඩි වී තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. 2023 දී ඇති වූ සැලකිය යුතු අලාභය කොටසකට ඉපැයීම කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇති කළ නමුත් 2024 දී ඇති වූ ධනාත්මක පරිවර්තනය යථා තත්ත්වයට පත්වීමේ සහ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්ය සාධනයේ ආරම්භක සලකුණු පෙන්නුම් කර ඇත.

(v) ණය අනුපාතය 2022 වර්ෂයේදී සියයට 50 සිට 2024 වර්ෂයේදී සියයට 58 දක්වා වැඩි වූ අතර, එය ණය මූල්‍යකරණය මත රඳා පැවැත්ම වැඩිවීමක් සහ ස්කන්ධය මත රඳා පැවැත්ම අඩුවීමක් පෙන්නුම් කරයි. එමඟින් වැඩි වූ මූල්‍ය උත්තෝලනය පිළිබිඹු කරයි.

(vi) 2022 වර්ෂයේදී වාර 0.60 සිට 2023 වර්ෂයේදී වාර 0.54 දක්වා අඩු වූ වත්කම් පිරිවැටුම් අනුපාතය 2024 වර්ෂයේදී වාර 0.55 දක්වා සුළු වර්ධනයක් වාර්තා කර තිබූ අතර, එමඟින් ආදායම උත්පාදනය සඳහා වත්කම් භාවිතයේ අඩු කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි.

(vii) ස්කන්ධ අනුපාතය 2022 වර්ෂයේදී සියයට 50 සිට 2024 වර්ෂයේදී සියයට 42 දක්වා අඩු වූ අතර, එම කාලපරිච්ඡේදය තුළ කොටස් හිමියන්ගේ ස්කන්ධය මගින් මූල්‍යකරණය කරන ලද වත්කම්වල අනුපාතය අඩුවීමක් පෙන්නුම් කරයි.

(viii) ස්කන්ධයට ණය අනුපාතය 2022 වර්ෂයේදී වාර 2.86 සිට 2024 වර්ෂයේදී වාර 3.66 දක්වා වැඩි වූ අතර, එමඟින් සමූහයේ මෙහෙයුම් සඳහා ස්කන්ධයට සාපේක්ෂව ණය මූල්‍යකරණය මත වැඩි විශ්වාසයක් ඇති බව පෙන්නුම් කරයි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
නව ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක සිට අන්තර්ජාලය හරහා දුම්රිය ටිකට්පත් මිලදී ගන්නා මගීන්ට සමාගම විසින් රු. බිලියන 1.149 ක් වටිනා M-ටිකට්පත් සේවා අඛණ්ඩව ලබා දී තිබුණි. පෙර ගිවිසුමේ 2.2.2 වගන්තිය අනුව	විධිමත් ගිවිසුම 2023.12.31 දින කල් ඉකුත් වූ බව අපි පිළිගනිමු. බොහෝ අවස්ථාවන්හිදී, අනුගමනය කරන ලද පරිචයට අනුව, ගෙවීම් සාමාන්‍යයෙන් සෑම දින 10 කට වරක් සිදු කර ඇති අතර සාමාන්‍යයෙන් මාසික එකතු කිරීම්	ගිවිසුම කඩිනමින් විධිමත් කළ යුතු අතර ගිවිසුමට අනුව සතිපතා කාල රාමුවක් තුළ එකතු කරන ලද අරමුදල් ප්‍රේෂණය කළ යුතුය.

දෛනික එකතු කිරීම් දුම්රිය දෙපාර්තමේන්තුවට සතිපතා ප්‍රේෂණය කිරීම අවශ්‍ය වුවද, 2024 වර්ෂයේදී ප්‍රේෂණ දින 8 සිට 36 දක්වා ප්‍රමාද වූ අතර, එය ගිවිසුම්ගත නියමයන්ට අනුකූල නොවීම පෙන්නුම් කරයි.	පියවීම සඳහා ගෙවීම් තුනක් සිදු කරනු ලබයි.	

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ සංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව සමාගම ස්ථාපිත කරන ලද මූලික අරමුණු අතරට, සෙලියුලර් ජංගම දුරකථන ජාල සැලසුම් කිරීම, ගොඩනැගීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම මෙන්ම විදුලි සංදේශ උපකරණ, පරිගණක දෘඩාංග සහ මෘදුකාංග ආනයනය කිරීම, අලෙවිකරණය සහ සිල්ලර වෙළඳාම ඇතුළත් වේ. කළමනාකාරිත්වය මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම යොමු කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ව්‍යාපාර සැලැස්මේ අයවැයගත ආදායම රු. මිලියන 48,621 ක් විය. කෙසේ වෙතත්, කාර්ය සාධන වාර්තාවේ තථ්‍ය ආදායම රු. මිලියන 45,524 ක් විය. ඒ අනුව, අපේක්ෂිත ආදායම සහ තථ්‍ය ආදායම අතර වෙනස සියයට 6 ක අඩුවීමක් නිරීක්ෂණය විය.	2024 ආරම්භක වාර්ෂික ව්‍යාපාර සැලැස්ම 2023 දෙසැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. පසුගිය වසර දෙක තුළ සමාගමේ ආදායම් පහත වැටීම සැලකිල්ලට ගනිමින්, 2021 දී අවසන් වරට අත්කර ගත් ආදායම් මට්ටම් අභිබවා යාමේ අරමුණින්, වඩාත් අභිලාෂකාමී මූල්‍ය ඉලක්ක සඳහා අවශ්‍යතාවය මණ්ඩලය අවධාරණය කරන ලදි. ඊට ප්‍රතිචාර වශයෙන්, කළමනාකාරිත්වය වැඩි කරන ලද ආදායම් සහ ලාභදායිතා ඉලක්ක සහිත සංශෝධිත සැලැස්මක් ඉදිරිපත් කරන ලදි. 2024 වර්ෂයේදී, තරඟකාරී සමාගම් දෙකක් අතර ඒකාබද්ධ වීම සැලකිය යුතු වෙළඳපල සංවර්ධනයක් වූ අතර එමඟින් ඔවුන්ගේ වෙළඳපල ආධිපත්‍යය සහ තරඟකාරී ස්ථානගත කිරීම සැලකිය යුතු ලෙස ශක්තිමත් විය. මෙම ඒකාබද්ධ වීම, අනෙකුත් තරඟකරුවන්ගේ ආක්‍රමණශීලී සහ බාධාකාරී ගාස්තු උපායමාර්ග සමඟ, වෙළඳපල තරඟකාරිත්වය තීව්‍ර කළ අතර මොබිටෙල් හි ආදායම් වර්ධනයට අභියෝග එල්ල විය. මෙම බාහිර පීඩන නොතකා, මොබිටෙල් එහි වසර දෙකක ආදායම් පහත වැටීම සාර්ථකව ආපසු හරවා 2024 වර්ෂයේදී ලාභදායිතාවයට නැවත පැමිණෙන ලද අතර එය කාර්ය සාධනයේ ධනාත්මක වෙනසක් සනිටුහන් කරන ලදි.	ආදායම් පුරෝකථනයේ නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ අනාගතයේදී කාර්ය සාධනයේ ධනාත්මක වෙනස වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) සමාගම විසින් අනුගමනය කරන ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය. තවද, 2022 අගෝස්තු මාසයේදී සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදන ප්‍රතිපත්තියේ 1.3 වගන්තියට පටහැනිව, 2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන දින දර්ශනයක් පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රසම්පාදන සාධාරණ ආකාරයකින් සිදු කර ඇත්දැයි තහවුරු කර ගැනීමට හෝ 2024 දෙසැම්බර් 31 වන දිනට ලබා ඇති ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය.	ප්‍රසම්පාදන ප්‍රතිපත්තියට අනුකූලව, ප්‍රසම්පාදන අංශය කාණ්ඩ ප්‍රසම්පාදන සැලැස්මක් සහ දින දර්ශනයක් සකස් කර ඇත. 2024 වර්ෂයේදී අවසන් කර 2024 අප්‍රේල් 10 වන දින පාර්ශවකරුවන් සමඟ හුවමාරු කර ගන්නා ලද අතර සවිස්තරාත්මක සමාලෝචනයක් මත පදනම්ව මෙම සැලැස්මේ වාර්ෂික ප්‍රසම්පාදන ප්‍රමුඛතා දක්වා ඇත.	ප්‍රසම්පාදන ප්‍රතිපත්තියට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සහ දින දර්ශනය පිළියෙල කළ යුතු අතර ප්‍රතිපත්තිය මණ්ඩලය විසින් අනුමත කළ යුතුය.
(ii) 2022 අගෝස්තු මාසයේදී සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදන ප්‍රතිපත්තියේ 4.4.4 වගන්තියෙන් අපගමනයක් නිරීක්ෂණය විය. එහිදී සමාගමේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව වරින් වර යාවත්කාලීන කර නොතිබුණු අතර එහි සමහර සටහන් 2016 පෙර ඒවා විය. මෙම නිතිපතා යාවත්කාලීන නොකිරීම, විභව නව සැපයුම්කරුවන් සඳහා සීමිත අවස්ථා ඇති කර තිබූ අතර අඛණ්ඩ සමාලෝචනය සහ ඇතුළත් කිරීම තුළින් සමාන අවස්ථා අවධාරණය කරන ප්‍රසම්පාදන ප්‍රතිපත්තියේ 1.6 වගන්තියට අනුකූල වී නොතිබුණි.	වර්තමානයේදී, වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමක් සිදු නොකෙරේ. නව සැපයුම්කරුට ඕනෑම වේලාවක වෙබ් අඩවිය හරහා හෝ අවශ්‍ය පරිදි කාණ්ඩ ගැනුම්කරුවන් හරහා ලියාපදිංචි විය හැකිය. 2024 වර්ෂයේදී නව සැපයුම්කරුවන් 64 දෙනෙකු ලියාපදිංචි කරන ලදි. විගණන නිර්දේශ මත පදනම්ව, වාර්ෂික නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් 2026 ජනවාරි මාසයේදී ආරම්භ කරනු ඇත.	සමාගමේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියට අනුව යාවත්කාලීන ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතුය.
(iii) 2024 වර්ෂයේදී, සමාගම විසින් ලැන්ඩ් රෝවර් රථයක්, ඉන්ධන බවුසරයක් සහ ට්‍රේලර් තුනක් අපහරණය කර තිබුණි. බවුසරය සහ ට්‍රේලර් විකිණීම සඳහා මුලින්	සමාගමේ ස්ථාපිත පරිචයට අනුව, විනිවිද පෙනෙන ලංසු තැබීමේ ක්‍රියාවලියකින් පසුව, ඉන්ධන බවුසරය සහ බහාලුම් ට්‍රේලරය ඉහළම ලංසුකරුට ප්‍රදානය කරන	තක්සේරු කළ වටිනාකම මත පදනම්ව අවම ලංසු වටිනාකමට වඩා විකුණුම් අගයන් තිබිය යුතුය.

රු. මිලියන 14 ක් තක්සේරු කර තිබුණි. කෙසේ වෙතත්, ලද ලංසු මෙම තක්සේරුවට වඩා අඩු වූ බැවින්, ටෙන්ඩරය අවලංගු කර තිබූ අතර, නව ටෙන්ඩර් ක්‍රියාවලියක් අවශ්‍ය විය. එසේ තිබියදීත්, නව ටෙන්ඩරයකින් තොරව වත්කම් රු. මිලියන 9.1 ක ඉහළම ලංසුවට විකුණා තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමට රු. මිලියන 4.9 ක පාඩුවක් සිදුවිය.	ලදි. තක්සේරුකරු විසින් ලබා දෙන වෙළඳපල තක්සේරු වාර්තාව මූලාශ්‍රයක් ලෙස භාවිතා කිරීම සඳහා පරිශීලක අංශය විසින් ලබාගෙන ඇත.	
(iv) වැලිකඩ ආයතනික කාර්යාලයේ කිලෝ වොට් 25 ක සූර්ය පැනල පද්ධතියක්, විදුලි වාහන ආරෝපණ ඒකකයක් සහ ඉන්ධන ටැංකි සඳහා මුදුන් වහල ස්ථාපනය කිරීම සඳහා වන ප්‍රසම්පාදනයට සමාගම මුලින් රු. මිලියන 12 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම අවසන් වූ පසු, නිසි අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව විදුලි වාහන ආරෝපණ ඒකකය ප්‍රසම්පාදන විෂය පථයෙන් බැහැර කර තිබුණි. මෙම බැහැර කිරීම තිබියදීත්, සූර්ය පැනල පද්ධතිය සහ වහලය ස්ථාපනය කිරීම රු. මිලියන 14.21 ක වියදමින් සිදු කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාගමට මූලික ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 2.21 ක අතිරික්ත පිරිවැයක් දැරීමට සිදුවිය.	මෙවැනි ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පැවැත්වූ පළමු අවස්ථාව මෙය බැවින්, පරිශීලක අංශය විසින් මූලික පිරිවැය ඇස්තමේන්තුව සංවිධානය තුළ මිල ගණන් සලකා බලා පමණක් සිදු කරන ලදි. එබැවින්, මෙම ආකාරයේ ව්‍යාපෘති සඳහා ප්‍රදානය කරන ලද තථ්‍ය මිල ආරම්භක ඇස්තමේන්තුගත පිරිවැයට වඩා වැඩි විය හැකිය.	අනාගතයේදී සමාගම වඩාත් විස්තීර්ණ පිරිවැය ඇස්තමේන්තු කිරීමේ ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය.

3.4 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ජංගම සංඥා පරීක්ෂණ සඳහා රු. මිලියන 16.68 ක් වටිනා විශේෂිත මෙවලම්වලින් සමන්විත වාහනයක් වරින් වර සංචිත වාහනයක් ලෙස භාවිතා කරන අතර එමඟින් උපකරණයේ ආරක්ෂාව සහ අනිසි භාවිතය අවදානමට ලක් කරයි, ඊට අමතරව, උපකරණවල ආරක්ෂාව	තීරණාත්මක සිදුවීම්වලදී පමණක් සංචිත අරමුණු සඳහා වාහනය භාවිතා කරයි. අවදානම අවම කිරීම සඳහා, ප්‍රවාහන අංශය විසින් සටහනක් නිකුත් කර වාහන හිමිකාරිත්වය අදාළ පරිශීලක අංශයට මාරු කරනු ලබයි.	පැහැදිලි වගවීමක් ස්ථාපිත කිරීම සඳහා මෙම වාහනය සහ එහි උපකරණ සඳහා නිශ්චිත දෙපාර්තමේන්තුවකට විධිමත් ලෙස වගකීම පැවරිය යුතුය.

සඳහා නම් කරන ලද වගකිවයුතු දෙපාර්තමේන්තුවක් නොමැති වීම, හානියක් හෝ අලාභයක් සිදුවූ විට වගවීමේ ගැටළු මතු කරයි.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) මානව සම්පත් මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අනුමත බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් සහ උසස් කිරීමේ ප්‍රතිපත්තියක් සමාගම සතුව නොතිබුණි.	පොදු ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි ඉස්මතු කරන විධිමත් මාර්ගෝපදේශයක් ලෙස විස්තීර්ණ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත. මෙම ප්‍රතිපත්ති අභ්‍යන්තර පාලන කණ්ඩායම විසින් සමාලෝචනය කරනු ලබන අතර 2026 ජනවාරි 31 වන දින වන විට ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ අනුමැතිය සඳහා යොමු කරනු ඇත.	මානව සම්පත්වල සුමට ක්‍රියාකාරිත්වය සඳහා එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සහ උසස්වීම් ප්‍රතිපත්තිය පිළියෙල කර අනුමත කළ යුතුය.
(ii) 2022 සිට 2024 දක්වා සේවක පිරිවැටුම සියයට 14 ත් 16 ත් අතර පරාසයක පැවති බව හෙළිදරව් විය. ඉවත් වූවන්ගෙන් බහුතරයක් වසර තුනකට අඩු කාලයක් සමාගම සමඟ සේවය කර ඇති බව 2024 වර්ෂයේදී සේවක පිරිවැටුම පිළිබඳ සිදු කරන ලද වැඩිදුර විශ්ලේෂණයෙන් නිරීක්ෂණය විය.	මෙය අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස කළමනාකරණය හඳුනාගෙන ඇති අතර අවධානය යොමු කිරීම සඳහා දැනටමත් පියවර කිහිපයක් ආරම්භ කර ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා, කර්මාන්ත වැටුප් සමීක්ෂණයක් පැවැත්වීමට කළමනාකාරිත්වය යෝජනා කරන අතර ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, සමාගමේ මූල්‍ය කාර්ය සාධනයට යටත්ව, පවතින කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූලව අභ්‍යන්තර වැටුප් ව්‍යුහයන් සකස් කිරීමට යෝජනා කරයි.	සමාගමේ මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩල පිරිවැටුම අවම කිරීම නිර්දේශ කෙරේ.

(iii)	කාර්ය මණ්ඩල අවශ්‍යතා තක්සේරු කිරීම, සංවිධානයේ සේවක සංඛ්‍යාව පිළියෙල කිරීම සහ වරින් වර යාවත්කාලීන කිරීම වැදගත් වුවද, විගණන සමාලෝචනය සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් නොමැතිකම අවදානමක් ඇති කරයි. මෙම පරතරය සුදුසු පිරිස් කාලීනව බඳවා ගැනීමට බාධාවක් විය හැකි අතර, එමඟින් සංවිධානයේ උපායමාර්ගික අරමුණු සපුරාලීමේ හැකියාවට බලපෑම් ඇති විය හැකිය.	කළමනාකරණ අනුමැතිය සහිතව වරින් වර මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව කාර්ය මණ්ඩල අවශ්‍යතා තක්සේරු කර බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, වර්තමානයේදී, ප්‍රධාන තනතුරු සඳහා වන ආදේශන සඳහා අනුමැතිය ලබා දෙනු ලබයි. එමෙන්ම, පරිශීලක අංශය විසින් තීරණාත්මක කාර්යභාරයන් සඳහා වලංගු ව්‍යාපාරික සාධාරණීකරණයන් ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් නව බඳවා ගැනීම් සඳහා කළමනාකරණ අනුමැතිය ලබා දෙනු ලබයි.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයක් සිටිය යුතු අතර ඒ අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය.
(iv)	ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සහ මෙහෙයුම් තනතුරු සඳහා සමාගම විධිමත් අනුප්‍රාප්තික සැලසුම් රාමුවක් ස්ථාපිත කර නොතිබුණි. එවැනි යාන්ත්‍රණයක් නොමැතිකම, විශේෂයෙන් තීරණාත්මක කාර්යභාරයන්හි නියුතු පුද්ගලයින්ගේ අනපේක්ෂිත විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම් හෝ දීර්ඝ කාලීන නොපැමිණීම් වැනි අවස්ථාවන්හිදී, සංවිධානයේ අඛණ්ඩතාවයට සැලකිය යුතු අවදානමක් ඇති කරයි.	2026 දෙවන කාර්තුව වන විට සම්පූර්ණ කිරීම ඉලක්ක කර ගනිමින් අනුප්‍රාප්තික සැලසුම් වැඩසටහන ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, ඉන් පසුව එය අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස දිගටම කරගෙන යනු ඇත. මෙම රාමුවට තීරණාත්මක කාර්යභාරයන් හඳුනා ගැනීම, විභව අනුප්‍රාප්තිකයින් තක්සේරු කිරීම සහ තීරණාත්මක තනතුරුවල අනපේක්ෂිත ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැනීම් හෝ දීර්ඝ කාලීන නොපැමිණීම්වලදී සංවිධානයේ අඛණ්ඩතාව සහ සුමට සංක්‍රාන්තිය සහතික කිරීම සඳහා ඉලක්කගත සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වනු ඇත.	සමාගමේ අනුප්‍රාප්තික සැලැස්ම පිළියෙල කළ යුතුය.